**e - ඥාන පියස වැඩසටහන**
**දියමන්ති ව්‍යාපෘතිය**
**සමානාය පාඩම් - 7 පාඩම**

| විෂය | ශ්‍රේණිය | වාරය | පාඩම/ඒකකය |
|---|---|---|---|
| චිත්‍ර කලාව | 10 | III | 6.1.5. තාවඩි මු. තුරෙයිසාමි ශිල්පියාගේ නිර්මාණ අගයමු |

- මොහු දකුණු ඉන්දීය තන්ජාවූර් (Thanjavur) සිතුවම්වල ශිල්පක්‍රම නිර්මාණ සඳහා භාවිත කර ඇත.
- යුරෝපා යථාර්ථවාදය (Realism) හා පෙරදිග සිතුවම් ලක්ෂණ සම්මිශ්‍රණයක් මොහුගේ සිතුවම්වල කැපී පෙනේ.
- යාපනයේ නල්ලූර් හි සට්ටනාදර් ශිව දේවාලයේ ඇති බිතු සිතුවම් අතර සුදු අත් ඇති පූජක රුව, ගණපති රූපය, සුදු කුකුළාගේ රූපය, හා සැරසිලි මොහුගේ විශිෂ්ට නිර්මාණ වේ.
- මෙම සිතුවම්වල ස්වභාවික වර්ණ භාවිතයත් පෙරදිග සම්ප්‍රදාය අනුගමනය කරමින් ලා වර්ණ
- ව්‍යාප්තියක් හඳුනාගත හැකි ය.
- විශේෂයෙන් ළා දුඹුරු වර්ණ මාලාවක් මෙම සිතුවම්වල දක ගත හැකි ය.
- හුණු බදාම මත ප්‍රෙස්කෝ සිකෝ ශිල්ප ක්‍රමයට බිතු සිතුවම් නිමවා ඇත.
- ඔහු තාවඩි මුරුගන් මූර්ති කෝවිලේ ද සිතුවම් නිර්මාණය කර ඇත. මෙම දේවාලයේ ඇති සිතුවම් අතර කිරි කාවඩි කරුවා, වල්ලි දෙවඟන බිහිකළ මුව දෙන, වශිෂ්ටර් හා කාරාම් පශු, කතරගම දෙවියන් මහලු බමුණකුගේ වෙස් ගෙන අලියාගෙන් වල්ලි දෙවඟන බේරීම, වැදි රූපය ආදිය වැදගත් නිර්මාණ ලෙස සැලකේ.

**<u>ක්‍රියාකාරකම</u>**

1) තාවඩි මු. තුරෙයිසාමි ශිල්පියා පිළිබඳ කෙටි හැඳින්වීමක් කරන්න.

2) තාවඩි මු. තුරෙයිසාමිගේ නිර්මාණවල සුවිශේෂී ලක්ෂණ නම් කරන්න.

3) පහත දී ඇති සිතුවම හඳුනාගනිමින් කෙටි හැඳින්වීමක් කරන්න

•හඳුනාගත් බව : ........................
•ශිල්පියා : ........................
•ශිල්ප ක්‍රමය : ........................
•වර්ණ භාවිතය : ........................
•ශිල්පීය කුසලතා: ........................



**<u>ඇගයීම</u>**

1) තාවඩි මු. තුරෙයිසාමි ශිල්පියාගේ නිර්මාණ, තොරතුරු හා ඡායාරූප එක්රැස් කරන්න

2) ඔහුගේ ප්‍රසිද්ධ නිර්මාණ හා ඒවා හමුවන ස්ථාන නම් කරන්න.

3) ඔහුගේ නිර්මාණ සඳහා බලපෑ කලා ආභාසය පිළිබද විස්තර කරන්න

4) තාවඩි මු. තුරෙයිසාමි ශිල්පියාගේ ප්‍රධාන සිතුවම් 2ක් ගෙන හඳුනාගත් බව, ශිල්ප ක්‍රමය, වර්ණ භාවිතය හා ශිල්පීය කුසලතා යන උප මාතෘකා ඔස්සේ කෙටි හැඳින්වීමක් කරන්න